# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2304/46 - 2022 නොවැම්බර් මස 02 වැනි බදාදා - 2022.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117 (2) සහ 117(3) වගන්ති ප්‍රකාරව, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය.

2022 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2022 ඔක්තෝබර් මස 26 වැනි දිනැති අංක 2303/18 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 සිවිල් ගුවන් සේවා (ගගන යාත්‍රාංගන පරිහරණය කිරීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 2(1) වන නියෝගයෙහි, "යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ (JIA)" යන වචන ඇතුළත් කිරීම මගින් ;
(2) එහි 2(2) වන උපනියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උප නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"2(3) මෙම නියෝගවල පටහැනිව කුමක් සඳහන් වුව ද, උපලේඛනගත ජාත්‍යන්තර ගුවන් සමාගමක් විසින් 2022 නොවැම්බර් මස 08 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත දක්වා ඇති පරිදි ගුවන් තොටුපළවල ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරු වෙත ගෙවිය යුතුය.

(i) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට (BIA) ගොඩබසින සෑම ගුවන් යානයක්ම 2022 නොවැම්බර් මස 08 වැනි දින සිට 2023 මාර්තු මස 31 දක්වා බලපැවැත්වෙන පරිදි අදාළ ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු වලින් අවම වශයෙන් 50% ඇමෙරිකානු ඩොලර් වලින් (USD) ගෙවිය යුතුය.

(ii) යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළට (JIA) ගොඩබසින සෑම ගුවන් යානයක්ම අදාළ ගොඩබෑසීම් සහ නැවතුම් ගාස්තු ඇමෙරිකානු ඩොලර් (USD) මුදලට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් (LKR) 2022 නොවැම්බර් මස 08 වැනි දින සිට 2023 මැයි මස 07 වැනි දින දක්වා මාස 06 ක කාලයක් සඳහා ගෙවිය යුතුය. ***

***"ප්‍රේෂණය ආරම්භ කළ දිනයේ සිට උපරිම වැඩ කරන දින 05 ක් ඇතුළත අදාළ ගෙවීමට මුදල් ලැබිය යුතුය". යන කොන්දේසියට යටත්ව ගෙවීම් සිදු කරනු ලබන දිනයේ දී පවතින මහ බැංකුවේ ඩොලර් විකුණුම් අගය ඇමෙරිකානු ඩොලරය රුපියලට හුවමාරුවන අනුපාතය ලෙසට සලකනු ලබන අතර මෙහි දී ප්‍රේෂණය ආරම්භ කළ හා මුදල් ලැබුණු දිනය අතරතුර විනිමය අනුපාතයේ ඇතිවන උච්චාවචනයන් නොසලකා හරිනු ලැබේ.

EOG 11 - 0015

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.